සැ. යු .- 2020.12.11 දින අංක 2206 දරන ගැසට් පත්‍රයේ II සහ I : III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,207 - 2020 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.12.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | — |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජනවාරි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 දෙසැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1301 – B 82087 — 403 (2020/12)

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. (ලියාපදිංචි අංක පීබී 62 පීකිව්) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 1842008, 2319093 (ගම්පහ ශාඛාව)
1307167, 1472055, 1829654, 860876
(කිරිබත්ගොඩ ශාඛාව).
ශාඛා : ගම්පහ සහ කිරිබත්ගොඩ.

2020 ඔක්තෝබර් මස 23 වැනි දින පැවැත්වූ සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්. අයි. කේ. ලෙව්වුමානන් විසින් ලියා සහතික කරන ලද 2011.11.07 වැනි දින අංක 1017 සහ සීමාව වැඩි කර ගැනීම සඳහා ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. වනිගසුන්දර විසින් ලියා සහතික කරන ලද 2013.12.11 සහ 2014.10.29 වැනි දින පිළිවෙලින් අංක 2524 සහ 2774 සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් අශ්මි ටී ජයසේකර විසින් ලියා සහතික කරන ලද 2019.01.08 වැනි දින අංක 80 දරන සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරය යටතේ ගම්පහ ඩිවෙලොප්මන්ට් කොම්පැණි (ප්‍රයිවේට්) ලිමිටඩ් යන අය බන්ධනදායීන් වශයෙන් සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්සිය හැත්තෑ අට මිලියන එකසිය හතර දහස් තුන්සිය හයයි ශත පනස් පහක (රු. 378,104,306.55) ක මුදලක් 2020 අගෝස්තු මස 18 වැනි දින වනවිට සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්

(පහත සඳහන් ණය ගිණුම් අංක සඳහා ගෙවීමට ඇති හිඟ මුළු මුදල්)

| | |
|---|---|
| 1. ණය ගිණුම් අංක 1842008 | රුපියල් 70,856,541.43 |
| 2. ණය ගිණුම් අංක 2319093 | රුපියල් 17,160,677.47 |
| 3. ණය ගිණුම් අංක 1307167 | රුපියල් 70,784,377.60 |
| 4. ණය ගිණුම් අංක 1472055 | රුපියල් 33,759,394.07 |
| 5. ණය ගිණුම් අංක 1829654 | රුපියල් 49,921,094.72 |
| 6. ණය ගිණුම් අංක 860876 | රුපියල් 135,622,221.26 |

එකී රුපියල් 378,104,306.55ක මුදල හා 2020.09.19 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වූ කාලයට වැඩි දුර පොළිය ද, (ණය ගිණුම් අංක 2319093 සඳහා පොළිය පමණක් බැහැර කර) ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1017, 2524, 2774 සහ 80 දරන බැඳුම්කරය මගින් සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### පළමු වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ රාගම් පත්තු අලුත්කුරු කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහ මහනගර සභා පරිපාලන සීමාව තුළ, අංක 223ඒ ගම්පහ ග්‍රාම නිලධාරි වසම, ගම්පහ ගමේ පිහිටි ''කෝන්ගහවත්ත සහ හික්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. කේ. වී. ජයතිස්ස විසින් 2003 පෙබරවාරි මස 10 වැනි දින සාදන ලද අංක 1231 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 දරන ඉඩමට මායිම්, එනම් උතුරට : මේරි බිසෝ මාවතින් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : වීරසිංහ, ඩී. රණසිංහ සහ ජී. ප්‍රනාන්දු යන අයට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : එස්. වික්‍රමසිංහ යන අයට අයත් ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් දහයක් (අ. 0, රූ. 2, පර්. 10) විශාල ඉඩම සහ එයට අයත් ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ

මෙය ගම්පහ ඉඩම් කාර්යාලයේ හිමිකම් පී 146/96 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැණුමක්

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තු අලුත්කුරු කෝරළේ, ගම්පහ ගමේ පිහිටි ''කෝන්ගහවත්ත සහ හික්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක සී. අයි. වික්‍රමනායක විසින් 1943 ජනවාරි මස 31 වැනි දින සාදන ලද අංක 677 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක ඒ දරන ඉඩමට මායිම්, එනම් උතුරට : මේරි බිසෝ මාවතින් ද, නැගෙනහිරට : ලොට් බී ගෙන් ද, දකුණට : වීරසිංහ, කරෝලිස් ගුණරත්න සහ හරමානිස් ඩයස් යන අයගේ උරුමක්කරුවන්ට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : කෝන්ගහවත්ත ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් දෙළහක් (අ. 0, රූ. 2, පර්. 12) විශාල ඉඩම සහ එයට අයත් ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

මෙය ගම්පහ ඉඩම් කාර්යාලයේ හිමිකම් පී 146/96 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ රාගම් පත්තු අලුත්කුරු කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහ මහනගර සභා පරිපාලන සීමාව තුළ, අංක 348 ගම්පහ ග්‍රාම නිලධාරි වසම, කොට්ඨාස අංක 4 ගම්පහ මැදගම ගමේ පිහිටි ''කෝන්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක එම්. පී, රණසිංහ විසින් 1994 මාර්තු මස 10 වැනි දින සාදන ලද අංක 06/94 දරන

පිඹුරේ නිරූපිත ලොට් අංක බී1 දරන ඉඩමට මායිම් එනම් උතුරට : එල්. ඒ. ඩී. චන්ද්‍රරත්න යන අයට අයත් වරිපනම් අංක 52න් ද, සහ එම්. ඩී. පී. සමරසිංහ යන අයට අයත් මේරි බිසෝ මාවත අංක 50 දරන ඉඩමෙන් ද, නැගෙනහිරට : අනුර ලොකු බාලසූරිය යන අයට අයත් වරිපනම් අංක 3/1 තිස්ස පාර සහ ලොට් බී ගෙන් ද සහ එල්. ඒ. ඩී. චන්ද්‍රරත්න යන අයට අයත් වරිපනම් අංක 52 මේරි බිසෝ මාවතෙන් ද, දකුණට : ලොට් බී 2 සහ ලොට් බී4 න් ද සහ බස්නාහිරට : ඩී. රණසිංහ යන අයට අයත් වරිපනම් අංක 95, බෞද්ධාලෝක මාවතෙන් ද සහ ලොට් අංක ඒ ගෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දෙළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම සහ එයට අයත් ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

මෙය ගම්පහ ඉඩම් කාර්යාලයේ හිමිකම් පී 146/97 යටතේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහ මහනගර සභා පරිපාලන සීමාව තුළ අංක 4 මැදගම ග්‍රාම නිලධාරි වසම, ගම්පහ ගමේ උසාවි පාර හි පිහිටි ඉඩමට බලයලත් මානක ජේ. එම්. එෆ්. එස්. විරසිංහ විසින් 2002.02.12 වැනි දිනැති මැන සාදන ලද සහාධිපත්‍ය අංක 992 දරන ගම්පහ උසාවිය පාරේ වරිපනම් අංක 41/C/1/1 දරන 1 වන මහලේ ව්‍යාපාරික සහාධිපත්‍ය කොටස SIFB හි මායිම් උතුරට : පිඹුරු අංක 699හි ලොට් අංක C සහ CE1ට ඉහලින් එළිමහන ද, නැගෙනහිරට : CE 3න් ද, දකුණට : CE 2ට ඉහලින් එළිමහන ද, බස්නාහිරට : CE 1ට ඉහලින් එළිමහන ද

අධෝබින්දුව (Nadir) : ඒකක D1හි C/C ගෙන් ද
ශීරෝබින්දුව (Zenith) : ඉහළ ඒකක A1 A2 හි C/C ගෙන් ද
මෙහි බිම් ප්‍රමාණය වර්ග මීටර් 66.29 සහාධිපත්‍ය කොටස
SIFB ව්‍යාපාර දෙපලකින් සමන්විතය.

SIFB සහාධිපත්‍ය කොටස සඳහා ආසන්නතම පොදු ප්‍රවේශය සඳහා භාවිතයට CE1 සහ CE2, CE3, CE4 සහ CE5 වේ. මෙය ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව සහාධිපත්‍ය පී 5/27 යටතේ ලියාපදිංචි කර ඇත.

4. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහ මහනගර සභා පරිපාලන සීමාව තුළ, අංක 4 මැදගම ග්‍රාම නිලධාරි වසම, ගම්පහ ගමේ උසාවි පාර හි පිහිටි ඉඩමට බලයලත් මානක ජේ. එම්. එෆ්. එස්. වීරසිංහ විසින් 2002.02.12 වැනි දිනැති මැන සාදන ලද සහාධිපත්‍ය අංක 992 දරන ගම්පහ උසාවිය පාරේ වරිපනම් අංක 41/C/1/2 වඩාත් නිවැරදිව 41/C/2/1, 2 වන මහලේ ව්‍යාපාරික සහාධිපත්‍ය කොටස SIFB D1ට මායිම්, උතුරට : පිඹුරු අංක 699හි ලොට් අංක Cට ඉහලින් මෙම ඒකකයේ C/W එළිමහනෙන් ද, නැගෙනහිරට : මෙම ඒකකයේ C/W සහ CE3 න් ද, දකුණට : CE2 ට ඉහළින් එළිමහන ද, බස්නාහිරට : CE2ට ඉහලින් එළිමහන ද, අධෝබින්දුව (Nadir) ඒකක C1හි ඉහලින් C/C ගෙන් ද, ශිරෝබින්දුව (Zenith) මෙම ඒකකයේ වහලෙන් ද, මෙහි බිම් ප්‍රමාණය වර්ග මීටර 67 සහාධිපත්‍ය කොටස SIFB ව්‍යාපාර දෙපලකින් සමන්විතය.

SIFB සහාධිපත්‍ය කොටස සඳහා ආසන්නම පොදු ප්‍රවේශය සඳහා භාවිතයට CE1 සහ CE2, CE3, CE4 සහ CE6 වේ. මෙය ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව සහාධිපත්‍ය පී 5/42 යටතේ ලියාපදිංචි කර ඇත.

පොදු හිමිකම් පහසුකම් දේපළහි 5.555% සහ SIFB-CE13 සහාධිපත්‍ය පොදු භාවිතයට ඇති කොටස ද වේ.

### දෙවන උපලේඛනය

(I) වර්ෂ 2003 අංක 39 දරන සංශෝධිත පනතින් 1982 අංක 45 දරන සංශෝධිත පනතේ 12 වන වගන්තියෙන් සංශෝධනය කරන ලද 1973 අංක 11 දරන මහල් නිවාස හිමිකම් පනතේ 26 වැනි වගන්තිය යටතේ වන විධිවිධානයන්ට අනුව වන ව්‍යවස්ථානුකූල පොදු කොටස්

1. මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩම සහ මෙම සහාධිපත්‍ය දේපල අඩංගු එළිමහන ද සමග වේ.

2. අත්තිවාරම, කුළුණු, බාල්ක, බීම්, ආධාරක, ප්‍රධාන බිත්ති, ලොබිය, පඩිපෙල්, ගින්නක් ඇති වූ විට ඉවත්වීමේ මඟ සහ ගොඩනැගිල්ලේ බිත්තිය.

3. විදුලිබලය, දුරකථන, ගුවන්විදුලි, රැහැන් මගින් ගුවන්විදුලි, රූපවාහිනී සේවාවන් ලබා ගැනීම, ජලනල, ජල ටැංකි, වතුර වලවල්, මුදුනෙහි ජල ටැංකි, පොම්ප කාමරය, නලය, කසල කාණු මාර්ගය, මනුබිල සහ කසල බැහැර කිරීම වැනි මධ්‍යම සේවාවේ සවි කිරීම්.

4. මෙම දේපලේ පැවැත්ම, නඩත්තුව සහ ආරක්ෂාව සඳහා පොදු භාවිතයට අවශ්‍ය අනිකුත් උපාංග සහ පහසුකම්

(II) පිඹුරේ පිටු අංක 3 සිට 5 දක්වා ඇති විස්තර කර ඇති පොදු කොටස සහ ප්‍රදේශය

CE 1 : සියලුම ඒකක පාවිච්චිය සඳහා ඉඩම සහ එළිමහන
CE 2 : සියලුම ඒකක පාවිච්චිය සඳහා ඉඩම සහ එළිමහන
CE 3 : සියලුම ඒකක පාවිච්චිය සඳහා පඩි පෙළ
CE 4 : සියලුම ඒකක පාවිච්චිය සඳහා කොරිඩෝව
CE 5 : ඒකක C1 සිට C13 පාවිච්චිය සඳහා කොරිඩෝව
CE 6 : ඒකක D1 සිට D3 පාවිච්චිය සඳහා කොරිඩෝව

මණ්ඩලයේ අණ පරිදි,

මණ්ඩලයේ ලේකම්.

12 - 346

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

### (කළින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 110730000003.
ණයකරුගේ සම්පූර්ණ නම : ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ආර්. පෙරේරා විසින් 2019.07.05 වැනි දින ලියා සහතික කරන ලද අංක 3412 දරන උකස් බැඳුම්කරය මගින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV9113 දරන ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව සංස්ථාගත කරන ලද සීමාසහිත පෞද්ගලික සමාගමක් වන බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාරේ, අංක 445 1/2 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන් එහි අධ්‍යක්ෂකවරුන් වන චමින්ද්‍ර කිලිට්ටුව ගමගේ, ප්‍රමෝද්‍යා මංජරී කිලිට්ටුව ගමගේ හා අසෝක හේමචන්ද්‍ර යන අය උකස්කරුවන් වශයෙන් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී උකස් බැඳුම්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී චමින්ද්‍ර කිලිට්ටුව ගමගේ, ප්‍රමෝද්‍යා මංජරී කිලිට්ටුව ගමගේ හා අසෝක හේමචන්ද්‍ර යන අය ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකාරිත්වය දරන බැවින්, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට ප්‍රදානය කරන ලද ණය මුදල් නියම අර්ථලාභීන් වනුයේ, එකී සමාගම වෙනුවෙන් චමින්ද්‍ර කිලිට්ටුව ගමගේ, ප්‍රමෝද්‍යා මංජරී කිලිට්ටුව ගමගේ හා අසෝකා හේමචන්ද්‍ර යන අය හෙයින් ද,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් විසිඅට කෝටි තිස්හය ලක්ෂ දාහත් දහස් පන්සිය තුනයි ශත පහ (රු. 28,36,17,503.05) ක මුදලක් වර්ෂය 2020.10.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිඑක් කෝටි දොළොස් ලක්ෂ දෙදහස් තුන්සිය අසූනවයයි ශත පහළොව (රු. 211,202,389.15) ක මුදල ද, වර්ෂ 2020.10.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හත්කෝටි විසිහතර ලක්ෂ පහළොස් දහස් එකසිය දහතුනයි ශත අනූව (රු. 7,24,15,113.90) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් විසිඅට කෝටි තිස්හය ලක්ෂ දාහත් දහස් පන්සිය තුනයි ශත පහ (රු. 28,36,17,503.05) ක් ද,

(02) එකී ණය මුදලෙහි ආපසු නොගෙවූ මුදල වන රුපියල් විසිඑක් කෝටි දෙළොස් ලක්ෂ දෙදහස් තුන්සිය අසූනවයයි ශත පහළොව (රු. 21,12,02,389.15) ක මුදල මත 2020.11.01 දින සිට 2021.01.08 වැනි දින දක්වා සාමාන්‍ය හරිත ප්‍රමුඛ ණය අනුපාතිකයට (AWPLR) ඉහළින් සියයට තුනයි දශම පහක් (3.5%) බැගින් වූ අනුපාතිකය මත 9.92% ක පොළිය සහ 2021.01.08 වැනි දින සිට ඉදිරියට පවතින ණය මුදලේ ශීර්ෂය මත එක් එක් වර්ෂයේ සෑම තුන් මාසයකට වරක් එනම් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල අටවන (08 වන) දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය හරිත ප්‍රමුඛ ණය අනාපුතිකයට (AWPLR) ඉහළින් සියයට තුනයි දශම පහක (3.5%) බැගින් වූ අනුපාතිකය මත ගණනය කරනු ලබන පොළියක් එනම් (AWPLR+3.5%) යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දෙසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) ඊට අදාල පොළිය අයකර ගැනීම සඳහා ද,

(03) 2020.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) ඉහත කී සම්පූර්ණ හිඟ මුදල වන රුපියල් හත්කෝටි විසිහතර ලක්ෂ පන් දහස් පන්සිය දහතුනයි ශත අනූව (රු. 7,24,05,513.90) ක මුදල මත මාසිකව 1.50%ක ප්‍රමාද පොළියක් අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී, කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 2011 අංක 01 දරන පනතින් සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංන 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩුකහ දකුණු කෝරළේ, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1024 - පල්ලේකැකුළාවල ග්‍රාම නිලධාරී වසමේ පල්ලේකැකුළාවල ග්‍රාමයෙහි පිහිටි කැකුළාවල වත්ත (කැකුලාවල ගෘෘප්) නමැති ඉඩමට 2016 මැයි මස 24 වැනි දින කේ. ඒ. අමරතුංග බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංක 11124 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කුඹුර, පාර, රජයට

අයත් හබරලගස්හින්න නමැති ඉඩම, ජේ. ජී. ජයසූරියට අයිති ඉඩම හා කැකුළාවල වත්තේ කොටසක් ද, නැගෙනහිරට : රජයට අයත් හබරලගස්හින්න නමැති ඉඩම, කැකුළාවල වත්තේ කොටසක් හා කුරුන්ඩිවල වත්ත ද, දකුණට : කුරුන්ඩිවල වත්ත හා කීර්ති ගුණවර්ධනට අයිති ඉඩම ද සහ බටහිරට : කීර්ති ගුණවර්ධනට අයිති ඉඩම, කුඹුර, පාර, රජයට අයත් හබරලගස්හින්න නමැති ඉඩම හා ජේ. ජී. ජයසූරියට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි අක්කර විසිඅටයි රූඩ් තුනයි පර්චස් විසිනවයයි දශම හතරක (අ. 28, රූ. 3, පර්. .29.4) හෙවත් හෙක්ටෙයාර් එකොළහයි දශම හතයි බිංදුවයි නවයයි දෙකක (හෙක්. 11.7092) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් පස, බොරළු, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක U97/123හි ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ආර්. පෙරේරා විසින් 2019.07.05 වැනි දින ලියා සහතික කරන ලද අංක 3412 දරන උකස් බැඳුම්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
තැ. පෙ. 2085,
කොළඹ 02.

12 - 413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.